*සැ. යු.*– 2006.09.29 දින පළවූ අංක 1,465 දරන ගැසට් පත්‍රයේ VI(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,466- 2006 ඔක්තෝබර් 05 වැනි බ්‍රහස්පතින්දා - 2006.10.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ජේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 842 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... .. | 844 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 844 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ඔක්තෝබර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 සැප්තැම්බර් මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 287

අංකය : ඩී/ඒඑෆ්/545.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 දෙසැම්බර් මස 31 වන දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විං කමාන්ඩර් අජිත් ගොඩ්වින් නැතැනියල්ස් (01419) – පාලන/රෙජී

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක/ මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ ආමාත්‍යාංශය.

2006 ජුලි මස 03 දින,
කොළඹ දී ය.

10 – 117

---

2006 අංක 288

අංකය : ඩී/ඒඑෆ්/548.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2007 ජනවාරි මස 02 වන දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විං කමාන්ඩර් මුදලිගේ දොන් ජුඩ් සේනක සූරියාරච්චි (01455) – උපකරණ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ.
ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක/මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 08 දින,
කොළඹ දී ය.

10 – 91

---

2006 අංක 289

අංකය : ඩී/එෆ්/549

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2007 පෙබරවාරි 28 වැනි දින සිට පහත නම සඳහන් නිළධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විං කමාන්ඩර් සේමගේ ප්‍රියංජන් අනිල් ද සිල්වා (01541) – පාලන/රෙජී

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක/ මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 08 දින,
කොළඹ දී ය.

10 – 93

---

2006 අංක 290

අංකය : ඩී/ඒඑෆ්/536.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 මැයි මස 05 වන දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

ස්කොඩ්‍රන් ලීඩර් නීල් ජානක වික්‍රමසිංහ (01495) උපකරණ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක/මහජන ආරක්ෂාව, නීතිය හා සාමය
පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 05 දින,
කොළඹ දී ය.

10-96

2006 අංක 291

අංකය : ඩී/ඒඑෆ්/541.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 ජූනි මස 01 වන දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය සඳහා වෛද්‍ය හේතූන් මත නුසුදුසු වීම නිසා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

ස්කොඩ්රන් ලීඩර් – මාරසිංහ මුදියන්සේලාගේ ප්‍රසන්න අරුණ බණ්ඩාර මාරසිංහ – (01799) –පාලන/රෙජි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක/ මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූනි මස 26 වැනි දින,
කොළඹ දී ය.

10 –95

---

2006 අංක 292

අංකය : ඩී/ඒඑෆ්/31/ටී.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

2005 ඔක්තෝබර් මස 05 වැනි දින සිට පහත නම් සඳහන් කැඩෙට් නිලධාරීන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්වරුන් වශයෙන් පත් කිරීමටත් එදිනම සිට ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුලත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පල කොට ඇත.

11347 කැඩෙට් නිලධාරි ප්‍රේමනායක ගොඩකන්දගේ උපුල් නිශාන්ත ධර්මපාල නි. පො. රා. (02581)

11349 කැඩෙට් නිලධාරි එදිරිසිංහ පතිරණගේ දිනුෂ රංගන එදිරිසිංහ කාර්/ඉංජි (02582)

11350 කැඩෙට් නිලධාරි ඕපාත කංකානම්ගේ නුවන් චන්දන ගුණසේකර කාර්/සංඥා (02583)

11351 කැඩෙට් නිලධාරි මුතුකුඩ ආරච්චිගේ ගයාන් කුමාරගම කාර්/ඉංජි (02584)

11352 කැඩෙට් නිලධාරි චමිල ප්‍රදීප් කුමාරසිංහ කාර්/ඉංජි (02585)

11353 කැඩෙට් නිලධාරි විතානගේ චතුර මදුරංග කාර්/ඉංජි (02586)

11354 කැඩෙට් නිලධාරි උදිත කැලුම් ලක්මාල් මහානාම කාර්/සංඥා (02587)

11348 කැඩෙට් නිලධාරි මාරසිංහ ආරච්චිලාගේ දුමිදු දර්ශන මාරසිංහ නි. පො. රා. (02588)

11355 කැඩෙට් නිලධාරි හේරත් මුදියන්සෙලාගේ දොන් අනුරුද්ධ දසරත් පෙරේරා කාර්/ඉංජි (02589)

11306 කැඩෙට් නිලධාරි එරංග රොෂාන් වඩුගේ පාලන/රෙජි (02591)

11357 කැඩෙට් නිලධාරි අසංක චන්දිමාල් විජේසිංහ කාර්/සංඥා (02592)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්පී, ආර්එස්පී. පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක/මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය..

2006 අප්‍රේල් මස 24 දින,
කොළඹ දී ය.

10-92

---

2006 අංක 293

අංකය : ඩී/ඒඑෆ්/538.

## ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2006 අප්‍රේල් මස 30 දින සිට පහත නම සඳහන් නිළධාරියාගේ ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදා සේවයෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

| *නිලය* | *සම්පූර්ණ නම සහ සේවා අංකය* | *ශාඛාව* |
|---|---|---|
| බලපත්‍ර ලුතිනන් | – වර්ණකුලවීරසූරිය ජෝර්ජ් නලින් ප්‍රනාන්දු (ස්/0467) | ගු.තො.නි |

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ,
ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක/ මහජන ආරක්ෂාව.
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

10 – 94

# ආණ්ඩුවේ නිවේදන

## 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

### අංක 25/26 වෙනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධිත පනත්වලින්, සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥා පනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයන් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණයහිමියන් වෙත ආඥාපනතේ 25 (1) 26 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇන්. ඩබ්ලිව්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2006 සැප්තැම්බර් මස 19 වැනි දින,
අංක 428/11,
වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,.
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (1). 40279 | බාලසූරිය ආරච්චිලාගේ ඥාණවතී මිය, අංක 128, කුරුණෑගල පාර, දඹදෙනිය. | දොන් ප්ලෝරිස් අමරසිරි ජයකොඩි මයා, මත්තේගම, බෝපිටිය. |
| (2)40282 | ගුරුසිංහ ආරච්චිගේ යසරත්න මයා, අංක 3, අවිස්සාවේල්ල, පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය. | මංගප්පුලි දිසානායකගේ කුසුමාවතී මිය, අංක 4, සව්සිරි උයන, කුඹුක. |
| (3) 40337 | කුලප්පුවාවඩු චතුරානී මිය, පාත්‍රකැටිය පාර, පොල්ලැව්ව, බටපොල. | එදිරිවීර ආරකට්ටුපටබැඳිගේ ඥාණසිරි මයා, කුඹුරුවත්ත, බටපොල. |
| (4) 40340 | අබේසිංහ ආරච්චිගේ ශ්‍රීමති මංගලිකා මිය, අංක 80/16/සී, ගම්පහ පාර, ඒකල. | පන්නල අප්පුහාමිලාගේ ලීලානි රූපිකා මිය, අංක 115, පන්සල පාර, වතුරුගම. |
| (5) 40341 | තිලකරත්න වීරසූරිය මුදියන්සේලාගේ ඥාණතිලක මයා, දික්ලන්ද (මහගෙදර), මහහේන, මණ්ඩාවල. | අරුණ සම්පත් කුඩා විතානගේ මයා, අංක 4, තිලක පාර, ගම්පහ. |
| (6) 40345 | පිනුම්කාරයාලාගේ සිරිසේන ජයසිරි මයා, අංක 27 සී, දෙගලතිරිය, උඩුගොඩ. | ජයසිංහ ආරච්චිලාගේ නදුන් සමීර ජයසිංහ මයා, තියඹරාහේන, දේවාල පාර, උඩුගොඩ. |
| (7) 40351 | ලියන ආරච්චිගේ ශ්‍රියාවතී පෙරේරා හෙවත් පල්ලියගුරුගේ ශ්‍රියාවතී මිය, අංක 120/30 සී, පියුම් නිවස, මෙගොඩ කොලොන්නාව වැල්ලම්පිටිය. | මුතුතන්තිරිගේ සිරිපාල කුරේ මයා, අංක 54/7, සී, ශ්‍රී ධර්මාරාම පාර, දෙමටගොඩ. කොළඹ 09 |
| (8) 40356 | සෙල්ලහාරදී ජානක ද සිල්වා මයා, "ලක්ෂ්මී විල", පරණ පොලිසිය පාර, මාවතගම. | සුල්තාන් මොහිදීන් අබ්දුල් කාදර් මයා, කදුරුඅංග, වැඋඩ, මාවතගම. |

10 –61

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 12/61627/ඩී12/218.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.04.07 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කැප්පෙටිපොල ප්‍රසිද්ධ නොතාරිස් එච්. අමරකෝන් විසින් සහතික කරන ලද 1997.06.24 දින හා අංක 8620 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, අඹගහවත්ත පදිංචි රාජපක්ෂ මාපා මුදියන්සේලාගේ සුමනපාල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.03.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ තිස් තුන්දහස් එකසිය හැට හතයි ශත තිස්තුනක (රු. 4,33,167.33) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 8620 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැත්තෑවයි ශත හතලිස් හතරක (රු. 170.44) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි

වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, බදුල්ල, කළුගල්පිටිය, අංක 48/1 හි බලයලත් වෙනදේසිකාර ඩබ්.ජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, වැවේගම පිහිටි පුරනේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දොරු එච්. එම්. සමරනායක විසින් සකසන ලද 1997.01.11 දින සහ අංක 633 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 33.50 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමහ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 සැප්තැම්බර් මස 22 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-138/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/32586/සීඩී3/210.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2005.05.12 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. කරුනාසේකර විසින් සහතික කරන ලද 1998.04.06 දින හා අංක 303 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම නුගේගොඩ පදිංචි රොහාන් නානායක්කාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.03.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ එකොලොස්දහස් එකසිය තිස් හතරයි ශත හතලිස් පහ (රු. 3,11,134.45)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 303 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය දහනවයයි ශත අසූහය (රු. 119.86) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ අවිස්සාවේල්ල පාර අංක 109 කොට්ටාව පිහිටි සම්බුද්ධ ථිරියගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එල්. සී. බී. රාජපක්ෂ විසින් සකසන ලද 1988.08.26 දින සහ අංක 185 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 6 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0. රූ. 0, පර්. 6ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමහ වේ.

තව ද, එකී මිණුම් පිඹුරේ කැබලි අංක 7 මතින් වැටී ඇති මාර්ග අයිතිය ද සමහ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරි.*

2006 සැප්තැම්බර් මස 22 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-138/4

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/33302/ටී6/857.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.07.14 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. පානදුර පදිංචි වත්තකුවත්ත වඩුගේ සුරාජ් ප්‍රනාන්දු සහ සෙල්ලප්පෙරුමගේ වරුණි ප්‍රියදර්ශනී ප්‍රනාන්දු පෙර අමරසේකර යන අයට 17% ක වාර්ෂික පොළී අනුපාතයක් මත අවුරුදු පහළොව (15) කින් ආපසු ගෙවිය යුතු රුපියල් එක්ලක්ෂ තිස්දාහ (රු. 1,30,000) ක දේපළක් නිවාස දේපළක් මිළදී ගැනීම සඳහා ප්‍රදානය කරන ලද බැවින් ද,

2. එකී වත්තකු වත්ත වඩුගේ සුරාජ් ප්‍රනාන්දු යන අය 1998.02.23 වැනි දින මියගිය අතර කොළඹ දිසා අධිකරණයේ නඩු අංක සීජී 5246 යටතේ 2006.01.06 දිනැති නියෝගය මගින් මියගිය වත්තකුවත්ත වඩුගේ සුරාජ් ප්‍රනාන්දු යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා ඔහුගේ භාර්යාව වන සෙල්ලප්පෙරුමගේ වරුණි ප්‍රියදර්ශණී ප්‍රනාන්දු පෙර අමරසේකර යන අය පත් කර ඇති බැවින් ද,

3. පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ටී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද 1998.01.06 දින හා අංක 496 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම එකී සෙල්ලප්පෙරුමගේ වරුණි ප්‍රියදර්ශණී ප්‍රනාන්දු පෙර අමරසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.06.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ අසූඑක් දහස් හැත්තෑවයි ශත හතලිස් හත (රු. 2,81,070.47) ක මුදලක්ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 496 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැටතුනයි ශත හැත්තෑ තුන (රු. 63.73) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

4. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ තල්පිටි දෙබැද්ද හි පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ තන්තිරිමුල්ල උප කාර්යාලයේ පිංචන්ත පිහිටි රුක්අත්තනගහවත්ත *හෙවත්* බදුල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් 1985.10.23 දින සකසන ලද අංක 5006 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0. රූ. 0, පර්. 22ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තව ද එකී මිණුම් පිඹුරේ කැබලි අංක 2 සහ ජී මතින් ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරි.

2006 සැප්තැම්බර් මස 22 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-138/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/28086/සීබී9/250.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2005.09.28 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. අවිස්සාවේල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ඩී. එස්. පින්නවල විසින් සහතික කරන ලද 1996.03.03 දින හා අංක 2758 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම හංවැල්ල පදිංචි ඒදිරිසිංහ කංකානමලාගේ දොන් රංජිත් මල්කාන්ත ඒදිරිසිංහ හෙවත් ඒදිරිසිංහ කංකානමලාගේ දොන් රංජිත් මල්කාන්ත යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.08.22 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ දහඅටදහස් දෙසිය විසි දෙකයි ශත හැත්තෑඅට (රු. 4,18,222.78)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2758 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය දහතුනයි ශත අනූනවය (රු. 113.99) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 මහානාම වූයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේය.

උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, (අවිස්සාවේල්ල ඉඩම්ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කය) ඉහළ හංවැල්ල පිහිටි මහයායවත්ත සහ පැටිකිරියවත්ත *හෙවත්* ඇවරිවත්ත *හෙවත්* කෝට්ටේ වලව්වේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එස්. පෙරේරා විසින් සකසන ලද 1960.07.26 දිනැති හා අංක 1963 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 23 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0. රූ. 0, පර්. 20ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරි.

2006 සැප්තැම්බර් මස 22 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-138/3

---

## මහජන බැංකුව-කඳාන ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත් 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.05.19 සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2004.12.15 දිනැති අංක 1750 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මහමඩ කලපුගේ රංජිත් සහ බත්තන රාලලාගේ චම්පිකා ජයලත් යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එකොලොස්ලක්ෂ හැටහත්දහස් හාරසියපනස් එකයි ශත හතර (රු. 11,67,451.04) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2005.09.22 දින සිට වර්ෂයකට 15.75% බැගින් රුපියල් එකොලොස්ලක්ෂ හැටහත්දහස් හාරසියපනස් එකයි ශත හතර (11,67,451.04) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තුද, සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එකොලොස්ලක්ෂ හැටහත්දහස් හාරසියපනස් එකයි ශත හතර (11,67,451.04) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 1750 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, රාගම පිහිටි බැද්දෙබෝගහවත්ත *හෙවත්* කෝන්ගහවත්ත *හෙවත්* කෝන්ගහවත්ත දෙකෙන් පංගුව හා මකුල්ලගහකුඹුරේ වනාත (වඩාත් නිවැරදි ලෙස මැදබෝගහ බටහිර කොටස *හෙවත්* කෝන්ගහවත්ත) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. ඩී. පෙරේරා විසින් 1985.11.13 වැනි දින මැන සකස් කළ අංක 8606 දරන පිඹුරේ ලොට් අංක 2 දරන කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : ලොට් අංක 3 ද, දකුණු-නැගෙනහිරට : මැද්දෙවත්ත පාර, දකුණු බටහිරට : ලොට් අංක 1 ද, උතුරු-බස්නාහිරට : ගොරකගහකුඹුර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහඅට (අ. 0, රූ. 0, පර්. 18) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 221/283 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර 111 කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

10-79

---

### ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ණය අංක : 603080 228416 /14%

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.06.28 දින පවත්වන ලද රැස්වීමේදී, මෙහි පහත දැක්වෙන යොජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. පී. බී. ජයසේකර විසින් ලියා සහතික කරන ලද අංක 3969 හා 2002.09.11 දින දරන උකස් බැඳුම්කරය මත අයකර ගත යුතු මුදල් ගෙවීම, රාගම, ඇලපිටිවල, අංක 87/7 දරන ස්ථානයේ හෙට්ටිආරච්චිගේ දොන් ජගත් නන්දන විජේරත්න මහතා විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2006.06.13 වන දිනට රුපියල් පන්ලක්ෂ අසූපන් දහස් අටසිය පනස් හතරකුත් ශත හැට එකක (රු.5,85,854.61) මුදලක් ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,85,854.61ක මුදල 2006.06.13 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට දාහතර (14%) බැගින් පොලිය ද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 3969 දරන උකස් බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ හා පරිශ්‍රය, බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි, 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානයකරන ලද ණයඅයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ (වැලිසර උපකාර්යාල) බල ප්‍රදේශය ඇතුළත වැලිසර පිහිටි සියඹලාගහවත්ත, ඇමුණුපිටියේවත්ත, දවටගහවත්ත *නොහොත්* කහටගහකුරුඳුවත්ත, හීනටිකුඹුර, කහටගහකුඹුර, සියඹලාගහවත්ත, මෙනේරිපිටියේ වත්ත, සහ දවටගහවත්ත නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 1631 හා 1997.12.20 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 13 ලෙස ලකුණු කළ හුණුපිටිය පාර වරිපනම් අංක 50/51 දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, උතුරට : ලොට් අංක 10 ද; නැගෙනහිරට : ලොට් අංක 16 ද ; දකුණට : ලොට් අංක 15 ද, බස්නාහිරට : ලොට් අංක 12,14, සහ 19 ද යන මායිම ඇතුළත එකී අංක 1631 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහහතරක් (අ. 0, රූ. 0, පර්. 14) විශාලත්වය ඇති ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 506/173 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙයට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. පතිරණ විසින් මැන සාදන ලද අංක 1740 හා 1996.08.13 දින දරන පිඹුරේ (අඩි 20ක් පළල) ලොට් අංක 16 සහ 17 දරන බිම් කට්ටි මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

කළමනාකරු - ණය.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

10-52

---

### මහජන බැංකුව - කුරුණෑගල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පණතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.07 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස්, සමන් හපුවත්ත මහතා විසින් සහතික කරන ලද, 1999.01.28 දින අංක 12953 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, නරසිංහ දේවගේ සරත් වික්‍රම රණසිංහ සහ නරසිංහ දේවගේ නිමල් රණසිංහ යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, 2002.06.01 වැනි දින සිට වර්ෂයකට සියයට විසි හත (27%) බැගින් රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අය කර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබීමට ඇති නම් ඒවා අඩුකර එකී රුපියල් දෙලක්ෂ පනස් දහසක (රු. 2,50,000) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 12953 දරන උගස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති

දේපල/දේපලයන් සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, හේවාවිස්ස කෝරළේ වැඋඩවිල්ලි හත්පත්තුවේ, “උකුවත්තේගොඩ නමැති ගමේ පිහිටි පහළ ගෝනටුව කුඹුර, පල්ලේකොටුව කුඹුර *නොහොත්* පල්ලේගෝනටුව කුඹුර සහ ගෝනටුව කුඹුර ” නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර මහතා විසින් මැන සාදන ලද 1991.06.29 දින අංක 3825 දරන පිඹුරෙහි දක්වා ඇති බෙදා වෙන් කරන ලද ලොට් 03 දරන ඉඩම, උතුරට : ලොට් 02ද ; නැගෙනහිරට : ලොට් 02 සහ ප්‍රධාන පාර ද ; දකුණට : ගම් සභා පාර සහ ලොට් 07 ද ; බස්නාහිරට : ලොට් 07 සහ ඉවුරද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිස් හතයි දශම පහයි බිංදුවක් (අ.0, රූ. 02, පර්. 37.50) විශාල වූ ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

එකී ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩම් තුන ඒකාබද්ධ කොට සාදන ලද ඉඩම නැවත මැන සාදන ලද්දකි. ඉහත කී උක්වත්තේගොඩ නමැති ගමේ පිහිටි “පල්ලේකොටුව කුඹුර ” නමැති ඉඩමේ නොබෙදූ දෙකෙන් එක පංගුව (1/2), උතුරට : කලුමැනිකාට අයිති ගෝනටුව කුඹුර ද, නැගෙනහිරට කලුමැනිකාට සහ බණ්ඩිරාලට අයිති ගෝනටුව කුඹුර ද, දකුණට: ගන්ගොල්ලේපිටිය වෙල් වැට ද, බස්නාහිරට ජාකඩේ දේවාලයට අයිති ගෝනටුව කුඹුර ද, යන මායිම් තුළ පිහිටි වී පැල් එකයි ලාස් පහක වපසරියකින් යුතු ඉඩම (ඒ 727/21 කුරුණෑගල),

ඉහත කී උක්වත්තේගොඩ නමැති ගමේ පිහිටි “ගෝනටුව කුඹුර” නමැති ඉඩමේ නොබෙදූ දෙකෙන් එක පංගුව (1/2), උතුරට :කලුමැනිකාට අයිති ගෝනටුව කුඹුර සහ කොස් මහම්මදුගේ ගෝනටුව වත්ත ද; නැගෙනහිරට: කලුමැනිකාට අයිති ගෝනටුව කුඹුර ද, දකුණට : බණ්ඩාට අයිති ගෝනටුව ලියද්ද ද, බස්නාහිර : ගල්වැට ද, යන මායිම් තුළ පිහිටි වී පැල් එකයි ලාස් දෙකක වපසරියකින් යුත් ඉඩම. (ඒ 1025/251 කුරුණෑගල).

ඉහත කී උක්වත්තේගොඩ නමැති ගමේ පිහිටි පහළ ගෝනටුව කුඹුර නමැති ඉඩමේ නොබෙදූ 194/270 පංගුව, උතුරට : ඇල්හේන්පිටියේ වත්තේ වැට ද, නැගෙනහිරට : ගම් සභා පාර ද, දකුණට : මල්ලිය දේවාලය අයිති කුඹුරේ ඉම ද, බස්නාහිරට : අරුණ සහ තවත් අයට අයිති වත්තේ වැට ද, යන මායිම් තුළ පිහිටි වී පැලක වපසරියකින් යුත් ඉඩම (ඒ 466/184 කුරුණෑගල).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු,
කුරුණෑගල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03, වත්හිමි පාර,
කුරුණෑගල.

10-80

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු
1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත 'පිටපත' කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය" පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | | පිටරට | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ජේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ජේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ජේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ජේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ | | තැපැල් ගාස්තුව (මෙරට) | |
|---|---|---|---|---|---|
| | | රු. | ශ. | රු. | ශ. |
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ජේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ජේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ජේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැලකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2006 | | | |
| ඔක්තෝම්බර් | 2006.10.05 | බ්‍රහස්පතින්දා | 2006.09.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.10.13 | සිකුරාදා | 2006.09.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.10.20 | සිකුරාදා | 2006.10.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2006.10.27 | සිකුරාදා | 2006.10.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2006.11.03 | සිකුරාදා | 2006.10.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.11.10 | සිකුරාදා | 2006.10.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.11.17 | සිකුරාදා | 2006.11.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.11.24 | සිකුරාදා | 2006.11.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2006.12.01 | සිකුරාදා | 2006.11.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.12.08 | සිකුරාදා | 2006.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.12.15 | සිකුරාදා | 2006.12.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.12.22 | සිකුරාදා | 2006.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.12.29 | සිකුරාදා | 2006.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.